# රූපවාහිනී තාක්ෂණය විෂයයෙහිලා සංක්ෂිප්ත පෙරවදනක්

**මහාචාර්ය සේන නානායක්කාර**

"මොකද?"

"නෑ නිකං"

"නිකං නෙවේ.....මොකද TV එක දිහා බලාගෙන භාවනාවක ද?"

"නෑ..... මම මේ කල්පනා කෙරුවේ.... දැන් බලන්ඩ මේකෙ චැනල් පහළොවක් තියෙනව....."

"ඉතිං...?"

"ඒ වුණාට එහෙකවත් බලන්ඩ දෙයක් නෑනෙ.... ඔක්කොම ජරාවල්.... එක්කෝ වෙළෙඳ දැන්වීමක්.... එහෙම නැත්තං කුණු මෙගා නාට්‍යයක්.... ඒ දෙකම නැත්තං නිකං දේශපාලන පල්හෑල්ලක්..... වැඩකට ඇති දෙයක් කියල මොනවද තියෙන්නෙ.....?"

"අම්මාපල්ල එච්චරටම නැද්ද බලන්ඩ දෙයක්.....? මට නං එහෙම දෙයක් හිතෙන් නෑ. එකක් බැරිනං අනෙක දාල බලනව. කොච්චර හොඳ දේවල් තියෙනවද බලන්ඩ....? හා නැද්ද හොඳයි....?"

"තියෙනව....! මේකෙ නොපෙන්නපු දේවල්...."

සැබැවින්ම..... මෙය මගේ ලිපියෙහි මාතෘකාවට සෘජුවම අදාළ වන්නේ නැත. නමුත්, මෙබඳු විසංවාද අපට නිතර අසන්නට ලැබෙන බව කීම අතිශයෝක්තියක් නොවේ. එහෙත්, රූපවාහිනිය අපට දැන් නැතිවම බැරි අනිවාර්ය අංගයක් බවට පත්ව

ඇත. එය ඒ ඒ පුද්ගලයාට සමීප වනුයේ විවිධාකාරයෙනි. ඒ අනුව ඔවුනොවුන් ඒ සඳහා ප්‍රතිචාර දක්වනු පෙනේ. ඒ සඳහා බලපාන සාධක අතිශයින් විවිධාකාර ය. සංකීර්ණ ය. එය විද්‍යාත්මක ය. මනෝවිද්‍යාත්මක ය. ජීව විද්‍යාත්මක මෙන්ම මානව විද්‍යාත්මක ය. මේ කෙටි සටහන තුළ ඒ පිළිබඳ සාකච්ඡා නොකෙරේ. නමුත්, රූපවාහිනිය හා බැඳුණු තාක්ෂණ රටාව පිළිබඳ අතිශය සරලව උඩින් පල්ලෙන් අතපත ගා බලන්නට පමණක් මේ කෙටි සටහන උපයෝගි කරගනිමි.

තාක්ෂණය යනු කුමක්ද? එය හුදු යාන්ත්‍රිකත්වය හෝ කාර්මිකත්වය හා බැඳුණු ගැඹුරු අංගසූත්‍ර සමූහයක සමෝධානයක් යැයි සිතීම පටු ආකල්පයකි. Technical (තාක්ෂණික) යන ඉංග්‍රීසි වචනය ඇසූ පමණින් අප ඒ පටු ආකල්පය කෙරෙහි අවතීර්ණ වනු ඇතැයි යන්න මගේ පෞද්ගලික හැඟීමයි. එය අප සිත් තුළ ජනනය කරනුයේ එක්තරා ආකෘතියක සිරකෙරුණු නිශ්චිත ආකල්ප විශේෂයකි. යන්ත්‍ර සූත්‍ර, මෝටර්, ඇණ මුරිච්චි බඳු රළු බහුභාණ්ඩික සම්බන්ධතා සහිත ක්‍රියා විශේෂයකි.

ගැඹුරු දැකීමක් හා අවබෝධයක් රහිත කවරෙකු තුළ හෝ එකී සිතිවිලි සමුදාය මතු කෙරෙනු වැළැකිය නොහැකි ය.

මම මා නිදසුනට ගනිමි. මෙවර 'රූපවාහිනී සමීක්ෂා' ග්‍රන්ථය සඳහා තෝරාගත් තේමාව දැනගත් මොහොත මගේ සිහියට නැගෙයි. ජී.ඒ. ජිනප්‍රිය එහි සංස්කාරකවරයෙකි. ඔහු මා ළඟට පැමිණ එකවරම අතඇරියේ ගිනිබෝලයකි.

"මේ පාර සඟරාවෙ තේමාව 'රූපවාහිනි තාක්ෂණය'. " ඔහු කී ය.

"ඈ....? එතකොට මොනවද අපි ඒක ගැන ලියන්නෙ? මම නං තාක්ෂණය ගැන මෙලෝ හසරක් දන්නැ. දැන් මොකද කරන්නෙ....? මම මොනව ද ලියන්නෙ? මා විපිළිසර ය. ජිනප්‍රිය මා දෙස බලාසිටියි. ඔහු නැවත හඬ අවදි කළේ අලුත් යෝජනාවක් ද සමගිනි.

"සර් ඕක ගැන ටිකක් අහගන්ඩ ස්ටැන්ලි මහත්තයගෙං."

ඔහු ස්ටැන්ලි මහත්තෙය කීවේ දිගුකලක් රූපවාහිනියේ සේවය කළ ස්ටැන්ලි හෙට්ටිආරච්චිට ය. ඔහු රූපවාහිනී තාත්ෂණය පිළිබඳ නිවැරැදි අවබෝධය සහිත ප්‍රවීණයෙකි. අපගේ සමීප මිතුරෙක් ද වෙයි. මම ඔහු අමතන්නට වරක් දෙවරක් උත්සුක වීමි. වැඩක් වූයේ නැත. පසුව මම දිගින් දිගටම රූපවාහිනිය ගැන සිතන්නට වීමි. කොතෙක් හිතුව ද ලිවීමට සුදුසු යමක් ගැන අවබෝධය මතු නොවේ. මගේ හිත මේ තේමාවට යා නොදෙන බව පුන පුනා සිහිපත් වෙයි. එහෙත්, මේ අරුම පුදුම මාධ්‍ය මෙවලම වෙනත් මාධ්‍යයක් හා සැසඳීමේ දී දක්වන සුවිශේෂතාවම එහි තාක්ෂණයේ මහිමය කියාපාන බව මට සිතිනි. එබැවින්, මම ඒ ඔස්සේ මගේ කෙටි සටහන මෙහෙයවීමි. දැන් එතැන් සිට අපි අපේ අවධානය යොමු කරමු.

"අද්‍යතන සන්නිවේදන ක්ෂේත්‍රය පිළිබඳ කරුණු විමර්ශනය කිරීමේ දී විද්‍යුත් මාධ්‍යයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. විශ්වය කුඩා ගමක් බවට පත්කරවන්නටත්, විශ්ව ව්‍යාප්ත සමස්ත මානව සමාජය කුඩා පවුලක් බවට පත්කරවන්නටත් එහි ඇති ශක්‍යතාව ගැන කියැවෙන අනාවැකි ඒ සඳහා වන සංනිදර්ශනාත්මක පූර්විකා ලෙස සැලකිය හැකි අතර, නූතන රූපවාහිනී මාධ්‍යයට හිමිවනුයේ ප්‍රමුඛස්ථානය කි. එනම්,

සංවර්ධනය වෙමින් පවත්නා රටවල වඩාත් බලපෑම් සහගත සුවිශේෂතම මාධ්‍යය රූපවාහිනිය බවට විවාදයක් නැත. අප එසේ කියන්නේ ඇයි.....?

කාලීන පුවත් හා තොරතුරු විසරණයෙහි ප්‍රමුඛයා ලෙසත්, දැනුම, අවබෝධය හා උපදේශනය රැගත් අධ්‍යාපනික සන්නිවේදනයේ සමායෝජකයා ලෙසත්, විනෝදාස්වාදය සම්පාදනය උදෙසා සුවිශේෂ ශක්‍යතා සහිත විචිත්‍රවත්ම වාහකයා ලෙස මෙන්ම, අද්විතීය පෙළැඹවීම්කාර සගයකු ලෙසත්, සාමාන්‍ය ග්‍රාහක ප්‍රජාව කෙරෙහි එයින් සිදුකෙරෙන බලපෑම ඊට දෙස් දෙයි. ඒ හැර, සමාජ සංවිධානයෙහි ලා සමීපතම විද්‍යුත් නියෝජිතයා ලෙස මෙන්ම, සමාජ ආරක්ෂණයෙහි ලා වන ශක්තිමත්ම සාමාජිකයා ලෙසත් රූපවාහිනියට හිමි භූමිකාව අද්විතීය වෙයි. එපමණක් නොවේ. සමාජ ඒකාබද්ධකරණයෙහි ලා මෙන්ම විවිධ මතවාද විමසංනයෙහි ලා සැකසුණු වඩාත් පුළුල් සංවාද මණ්ඩපය ද රූපවාහිනිය බවට පත්ව ඇත.[1]

රූපවාහිනිය මඟින් සිදුකෙරෙන මේ සියලු කාර්යභාරයන් අතර වඩාත් සුවිශේෂ වන්නේ කුමක්දැයි කෙනෙකුට ප්‍රශ්නයක් පැන නඟින්නට ඉඩ ඇත. මගේ දැනුම හා විශ්වාසය මෙන්ම අත්දැකීම අනුව නම්, රූපවාහිනියේ ප්‍රමුඛතම කාර්යභාරය වී ඇත්තේ විනෝදාස්වාදය සම්පාදනය යි. අන් කවර අභිලාෂයක් ඉටු කළ ද, ඒ සියල්ල අභිබවා කවරාකාරයකින් හෝ මෙය පෙරමුණු ගෙන ඇති බව පෙනේ. ඕනෑම ජනමාධ්‍යයක් එහි ග්‍රාහක ප්‍රජාව අතර දිගුකලක් පවතින්නට නම්, අදාළ ජන බහුතරයක අරමුණු හා අපේක්ෂාවන් පිළිබඳ අවධානය යොමු කිරීම හා ඊට අදාළව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වෙයි.

එය + ලාංකේය ජන ජීවිතය හා කෙතරම් ඓන්ද්‍රීයය ලෙස තහවුරු වී ඇත්දැයි යන කාරණය ගැඹුරින් හෙළිදරව් කෙරෙන දත්ත අප්‍රමාණ ය. අධ්‍යාත්මය ඇත් කළ, හුදු විනෝදාස්වාදය ප්‍රමුඛ කොටගත් සමාජයක් නිර්මාණය වෙමින් පවත්නා බව ද විටෙක එතුළින් කියාපායි.

බස්නාහිර පළාතේ මා විසින් කරන ලද සමාජ සමීක්ෂණයක දී නිවාස 821 කින් යුත් නියැදියක් ප්‍රතිචාරක ක්ෂේත්‍රය ලෙස ඇසුරු කෙරිණි. බොහෝ නිවෙස් පවුල් ඒකක එකක් ලෙස ගැනිණි. සමහර නිවෙස් තුළ පවුල් දෙකක් ද, තවත් සුළු සංඛ්‍යාවක පවුල් ඒකක තුනක් වූ අවස්ථා ද විය. අප අරමුණ වූයේ **'පොත පත කියැවීම ඇතුළු අධ්‍යාපන කටයුතු හා රූපවාහිනී මාධ්‍ය ඇසුර'** පිළිබඳ සත්‍ය සංඛ්‍යානමය දත්ත සොයායාමයි. ඒ තුළින් එකී සමාජයේ අධ්‍යාත්මය සහ රසවින්දනය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් හෙළිදරව් කර ගත හැකිව තිබිණි. ඒ අරමුණ ඒ ආකාරයෙන්ම සාර්ථක ලෙස ඉටුකෙරුණු බව අපගේ විශ්වාසය යි. නිරීක්ෂණයට ලක් වූ සියලුම නිවෙස්වල රූපවාහිනියක් දක්නට ලැබිණි.

මෙතරම් ජන ආකර්ෂණයක් ලබන්නට තරම් එකී තාක්ෂණය සතු වූ සුවිශේෂතා මොනවාද? සාමාන්‍ය මහජනතාව එය පාවිච්චි කිරීමේ දී එහි පවත්නා ව්‍යවහාරික පහසුකම් කෙබඳු ද? ඒවා නිසි පරිදි කළමනාකරණය කරන්නේ කෙසේ ද? ඒ පිළිබඳ පොදු ජනතාවට ඇති දැනුම හා අවබෝධය කොතෙක් ද? ආදී ප්‍රශ්න ගණනාවක් මෙහිදී මතු කෙරෙනු ඇත. දැන් නැවතත් අපි අපේ සමීක්ෂණ දත්ත දෙසට හැරෙමු.

| | |
|---|---|
| **නිරීක්ෂණයට ලක් වූ නිවෙස් ගණන** | 821 |
| **රූපවාහිනී යන්ත්‍රයක් ඇති නිවෙස් ගණන** | 821 |
| **පාසල් යන දරුවන් සිටින නිවෙස් ගණන** | 601 |
| **අධ්‍යාපනයක් ලබන කවරකු හෝ සිටින නිවෙස් ගණන** | 713 |
| **විධිමත් පොත් රාක්කයක් සහිත නිවෙස් ගණන** | 01 |

මේ දත්ත හොඳින් කියවා බලන්න. රූපවාහිනිය පොදු ජන ජීවිතය හා කෙතරම් බැඳී ඇත්දැයි මෙයින් සිතා ගත නොහැකි ද? නමුත්, ඊට වඩා ගැඹුරින් සැලකිය යුතු වැදගත් අරුතක් එහි සැඟව ඇති බව පෙනේ. සෑම නිවෙසකම කුමන වර්ගයේ හෝ රූපවාහිනියක් තිබීම පැහැදිලිව දක්නට හැකි වුව ද, විධිමත් ලෙස සැකසුණු පොත් රාක්කයක් සහිත නිවෙස් වූයේ එකක් පමණි. අධ්‍යාපනය හෝ පොතපත කියැවීම සඳහා යොමු කරන අඩු අවධානයත්, රූපවාහිනියක අවශ්‍යතාව ඉටුකිරීම සඳහා යොමු කරන ඉහළ අවධානයත්, අහසට පොළොව මෙන් ඈත් වී ඇති බව පෙනේ. ස්මාට් ෆෝන්, පරිගණක යන්ත්‍ර හා ශීතකරණ ආදිය ද තවත් බොහෝ දේ ද ඒ අත්‍යවශ්‍ය භාණ්ඩ ලැයිස්තුවෙහි ප්‍රමුඛතා ගතකොට ඇත. නමුත්, මෙම සමීක්ෂණය දියත් කරනු ලැබුවේ 'පොතපත කියැවීම හා රූපවාහිනිය භාවිතය' තේමාකොට ගෙන බැවින්, සෙසු කාරණා අමතක කරමු.

"ඉතිං.... ගෙදරක පොත් රාක්කයක් නොතිබ්බයි කියල ඒ ගෙදර පොතපත කියවන මිනිස්සු නෑ කියල කියන්නෙ කොහොමද?"

කෙනෙකුට එබඳු ප්‍රශ්නයක් පැනනැගෙන්නට ඉඩ ඇත. සැබෑවකි. කුඩා කල සිය නිවෙස් තුළ පොත් රාක්කයක් පවත්වාගැනීම තබා අවම වශයෙන් වහලක් යට ජීවිතය ගත කිරීමට හෝ අවකාශය නොලද අය කොතෙක් ද? ඒ අතරින් උගතුන්, වියතුන්, චින්තකයින්, දාර්ශනිකයින් මෙන්ම ලෝකයට මග කියන විශිෂ්ට ලේඛකයින් ද බිහිවී නැද්ද? සත්‍යයකි. නමුත්, මෙහිදී අප - අප විසින් අනුගමනය කළ යුතු ආධ්‍යාත්මික ගුණවගාවෙහි ලා අත්‍යවශ්‍ය ප්‍රවේශයකට අදාළ පසුබිමක් පිළිබඳව ප්‍රායෝගිකව අවධානය යොමුකර නොමැති බව හෙළිදරව් වේ. එය අපට සපුරා ප්‍රතික්ෂේප කළ නොහැක්කකි.

ඒ අනුව, අධ්‍යාත්මය අතික්‍රමණය කරන ලද භෞතිකත්වය විසින් අද අප මෙහෙයවනු ලබයි. රූපවාහිනිය නම් වූ මේ විස්මජනක මෙවලම එතරම් ම බලසම්පන්න ය. ජවසම්පන්න ය. බලපෑම් සහගත ය. එසේ වන්නේ ඇයි?

එහි තාක්ෂණික හාස්කම නිසයි. එකී තාක්ෂණය හා බැඳුණු සමාජ විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක ඥාතිත්වය නිසයි.

රූපවාහිනී යන්ත්‍රයක් හිමිකර ගැනීම, එය ඇසුරු කිරීම, එය අනුගමය කිරීම හෝ නොකිරීම, එමගින් සමස්ත සමාජය තුළ සිදු කෙරෙන හෝ නොකෙරෙන විචල්‍යතාව හා එමගින් කුළුගැන්වෙන නව සමාජ ප්‍රවණතා ඈ මේ සකලවිධ ක්‍රියා සංසිද්ධීන් විෂයයෙහි ලා පූර්වෝක්ත තාක්ෂණ සුවිශේෂතා බලපැවැත්වෙයි.

එකී තාක්ෂණික ස්වරූපය කෙබන්දක් දැයි විමසීමේදී පැහැදිලි කරගත යුතු මූල පසුබිමක් වෙයි. එනම්, ආලෝක තරංග ඇසුරු කොටගෙන රූපය සිය ඇසට ගොදුරු

කරගන්නා මිනිසා, එයින්ම ස්වකීය මනස තුළ පරිකල්පන උත්පාදනයෙහි ලා අත්‍යවශ්‍ය මූලික ශක්‍යතා සපුරා ගනියි. එනම්, සරල සන්නිවේදන ක්‍රියාවලියක චක්‍රීයමය ව්‍යූහය පිළිබඳ සලකා බලද්දී හඬ ද්විතීය වන අතර, රූපය අද්විතීය වන බැවිනි. ක්ෂණිකත්වය (Immediecy) තුළින් වහා දැන්වෙන සංවේදනය මෙහිදී ප්‍රමුඛ වෙයි. එහිදී හඬ (Sound) ක්‍රියාකරනුයේ ද්විතීය සුවිශේෂතාවක් (Followed distinguished) ලෙස ය. කෙසේ වුවද, විද්‍යුත් මාධ්‍ය විද්‍යානුකූල භාවිතාවක් ලෙස මෙයින් තහවුරු කෙරෙනුයේ රූපය හා හඬ එක් වූ කල නිර්මාණය කෙරෙන ප්‍රබල මානව සන්නිවේදන ක්‍රියාවලියකි. ඒ තාක්ෂණය හා බැඳුණු මානව සම්බන්ධතාවක ප්‍රතිඵලයක් ලෙසයි.

ඒ අනුව, රූපය දෘෂ්ටිගෝචර ය. ඇස් කන් නාසා දිව හා සම ආදී වූ පංචේන්ද්‍රියන්ගෙන් වඩාත් වැදගත් වූ දෘෂ්ටීන්ද්‍රිය අප අධ්‍යාත්මය කෙරෙහි බලපෑම් කරන්නා වූ ආකාරය ඉතා සුවිශේෂ ය. ඉලෙක්ට්‍රෝන රූප රාශියකින් හා ශබ්ද මාලාවකින් කෙරෙන සංජානන ක්‍රියාවලිය රූපවාහිනිය මගින් සිදු කෙරෙයි.[2] එය රූපමය හා ශබ්දමය සංඥා හා සංකේතාවලියක් ලෙස (Visual and Auditory Signal & Symbols) මිනිස් මනස හා සම්බන්ධ කෙරේ. මෙකී රූප හා ශබ්ද යම්කිසි හැඟීම් මාත්‍රයක් නියෝජනය කරයි. ඒවා අඩු වැඩි වශයෙන් ප්‍රබල හෝ දුබල විය හැකිය. බලපෑම් කාරක ලෙස විචල්‍ය බවක් පෙන්නුම් කරයි. එහෙත් කිසියම් ගැඹුරු ප්‍රතිරූපයක නිෂ්පත්තියක් එමගින් හෙළිදරව් කෙරේ.[3] එනම්, මිනිසුන් කතාකරන, කන බොන, අඬින පලඬින හා හැසිරෙන කුඩුමහත් සකලවිධ ක්‍රියාකාරකම් පද්ධතියක මිනිස් පිළිඹිබුවක් මිනිස් මනසට ප්‍රදානය කරයි.

ප්‍රේක්ෂකයෝ, රසිකයෝ හෝ පොදුවේ ගත්කල ග්‍රාහකයෝ එය නරඹති. ස්වකීය සිත හා කිසියම් ගනුදෙනුවක යෙදෙති. එය ප්‍රතිචාරාත්මක ය. සැබැවින්ම එය පෙළ කියැවීමක්[4] (Text Reading) වෙයි. විටෙක අපි එය අනුකරණය කරමු. තවත් විටෙක පිළිගනිමු. පිළිකෙව් කරමු. දෘශ්‍යමය හා ශ්‍රව්‍යමය සංඥා හා සංකේත විසින් කිසියම් වෙනත් අරමුණක්, පරමාර්ථයක්, විශ්වාසයක් හෝ ක්‍රියාකාරකමක් දක්වා හෝ මිනිස් සිත ගමන් කරවනු ලබන්නේ එලෙසිනි. උක්ත තාක්ෂණික පදනම මත යථාර්ථවත් කෙරෙන මනෝවිද්‍යාත්මක ක්‍රියාවලිය එය යි.

ඒ අනුව, එහි තාක්ෂණමය ස්වරයයත්, මානව ක්‍රියාවලියත් මූලික වශයෙන් පදනම් කොටගත් ප්‍රමුඛ කාරණා ත්‍රිත්වයකි.

1. රූපවාහිනිය වූ කලී විද්‍යුතය හා බැඳුණකි.
2. එය රූපයේත් ශබ්දයේත් සුසංයෝගය කේන්ද්‍ර වූවකි.
3. ගෘහස්ථ භාවිතය හා බැඳුණු සරල මෙවලමකි.

රූපවාහිනිය ක්‍රියාකරවීමේ දී, එනම්, ඊට අදාළ සන්නිවේදන කටයුතු සිදුකිරීමේ දී මේ පසුබිම් තත්ත්වයන් සපුරා බලපැවැත්වෙයි. රූපවාහිනිය සඳහා සංකල්පනා ගොඩනැඟීම, නිර්මාණ සැලසුම්කරණය, ක්ෂේත්‍ර හෝ ඉසව් තෝරාගැනීම, නළු නිළි ශිල්පී හෝ වෙනත් මානව සම්පත් වරණය, පිටපත් සැකසීම, රංගන, නර්තන, කථන, නිවේදන ඇතුළු ඉදිරිපත්කිරීම්කරණය, ප්‍රචාරණය හා දැන්වීම්කරණය, සංගීත සංයෝජනය, ආලෝකකරණය, අංගරචනය, ඇඳුම් නිර්මාණකරණය, පසුතල

නිර්මාණය, කැමරාකරණය, සංස්කරණය, නිෂ්පාදනය හා අධ්‍යක්‍ෂණය ආදී සලකවිධ කාර්යයන් කෙරෙහි උක්ත තත්ත්වයන්ට අදාළ කරුණු සලකා බැලේ.

සෘජු ලෙසම එකී කාර්යයන් හා තදනුබද්ධ ලෙස බැඳී පවතින බැවින් ඒවා රූපවාහිනී මාධ්‍යකරණය තුළ පිළිපැදිය යුතු ශික්ෂාවන් තරමටම ආත්ම කොටගනු පෙනේ. ඊට පයින් ගසා එකී විනය කඩකෙරේ නම් රූපවාහිනී මාධ්‍යකරණයේ සාර්ථකත්වයක් අපේක්ෂා කළ නොහැකි ය. සංගීතමය, නාට්‍යමය, නර්තනමය ආදී ප්‍රාසංගික හෝ සාකච්ඡාමය, සංවාදමය, වාචික, ප්‍රශ්න විචාරාත්මක, විචිත්‍රාංගමය, වාර්තාමය, ප්‍රවෘත්තිමය, දැන්වීම් හා ප්‍රචාරණමය හෝ වෙනයම් ඕනෑම වැඩසටහන් ප්‍රවර්ගයක දී (ශානරයකදී) වුව ද වෙසෙසකින් තොරව මේ කරුණු සලකා බැලිය යුතුව ඇත. මන්දයත්, ඒ සියල්ල විකාශය වනුයේ රූපවාහිනිය මාධ්‍යයෙන් බැවිනි. එය සරලව සාකච්ඡා කළ නොහැක්කකි.

එබැවින්, මේ කරුණු ත්‍රිත්වය ගැඹුරින් විග්‍රහ කිරීමෙන් එහි තාක්‍ෂණික ස්වරූපයේ අභ්‍යන්තරික ස්වරූපයත්, සමාජ මානව ක්‍රියාවලියේ න්‍යායයික හා ප්‍රායෝගික යථාර්ථයත් පහසුවෙන් හෙළිදරව් කෙරේ. එය වෙනත් දිගු ලේඛනයකින් කළ යුත්තකැයි අවධාරණය කරමි.

## සටහන්

1. නානායක්කාර, සේන (2014) රූපවාහිනී සමීක්ෂා, 7 කලාපය (සංස්කාරක සටහන) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, ix පිටුව.
2. Eastman, Susan Tyler, Sydney W. Heard and Lewis Klein (1981) Television. Images and Mass Concsiousness, (2nd ed.) Wordswoth, Belmont, Calif, p.121
3. Ibid, p.122
4. Slant, Richerd (Former President of Colombia Broadcasting Company, Washington) (1986), How Television Makes up Your mind: Essays on Television as a Social and Cultural Force, NY, p.21